# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 94 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 19/01/2024<br>පැය 1230 |

**මාධ්‍ය නිවේදනය**

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරිම.**

**01. 2024.01.18 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 01 | 01 | - | 380 | යකඩ බැරල් 02 |

වැටලීම් සිදුකර අත්අඩංගුවට ගන්නා ලද සැකකරු හා දේපල අදාළ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**02. අනවසරයෙන් මැණික් ගරමින් සිටි සැකකරුවන් සිව්දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පූගොඩ කඳවුර.**

2024.01.18 වන දින සවස් කාලයේදී අවිස්සාවේල්ල පොලිස් වසමේ කුඩගම ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා පූගොඩ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **කැළණි ගං ඉවුර බාදනය වන සේ මැණික් ගරමින් සිටි සැකකරුවන් සිව්දෙනෙකු** අත්අඩංගුවට ගෙන අවිස්සාවේල්ල පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 39,42,43 හා 49 වයස් වල පසුවන අවිස්සාවේල්ල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.

අවිස්සාවේල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මාන්කුලම් කඳවුර.**

2024.01.18 වන දින සවස් කාලයේදී අයියන්කුලම් පොලිස් වසමේ පලෙයිමුරුකණ්ඩි ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා මාන්කුලම් කඳවුරේ නිලධාරීන් විසින් ලද තොරතුරු මත වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන අයියන්කුලම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 54 ක් වූ මාන්කුලම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.

අයියන්කුලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තිරුක්කෝවිල් කඳවුර.**

2024.01.18 වන දින උදෑසන කාලයේදී තිරුක්කෝවිල් පොලිස් වසමේ කංචිකුඩිච්ආරු ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා තිරුක්කෝවිල් කඳවුරේ නිලධාරීන් විසින් ලද තොරතුරු මත වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන තිරුක්කෝවිල් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වූ තිරුක්කෝවිල් 04 ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.

තිරුක්කෝවිල් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05. විදේශීය රටක නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා රත්ගම කඳවුර.**

2024.01.18 වන දින දහවල් කාලයේදී අම්බලන්ගොඩ පොලිස් වසමේ සරසවි හන්දිය ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා රත්ගම කඳවුරේ නිලධාරීන් විසින් ලද තොරතුරු මත වැටලීමක් සිදු කර **විදේශීය රටක නිෂ්පාදිත ගිනි අවියක්, එම මැගසින් 01 ක් හා එම පතරොම් 14 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු ව්‍යාජ අංක තහඩු සවි කල යතුරු පැදියකින් ගමන් කරමින් සිටියදි** අත්අඩංගුවට ගෙන අම්බලන්ගොඩ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 29 හා 39 ක් වූ පන්නිපිටිය හා බලපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.

අම්බලන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි

**06. බලපත්‍ර නොමැතිව එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදා ගනිමින් පස් කැණීම් කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සෙට්ටිකුලම කඳවුර.**

2024.01.18 වන දින සවස් කාලයේදී පරසන්ගස්වැව පොලිස් වසමේ පරසන්ගස්වැව ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සෙට්ටිකුලම කඳවුරේ නිලධාරීන් විසින් ලද තොරතුරු මත වැටලීමක් සිදු කර **බලපත්‍ර නොමැතිව එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදා ගනිමින් පස් කැණීම් කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන සෙට්ටිකුලම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 31 හා 42 වයස් වල පසුවන අනුරාධපුරය හා පරසන්ගස්වැව ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.

පරසන්ගස්වැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**07. ලොරි රථයකින් කසළ තේ ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සෝදිසි කිරීම් හා බෝම්බ නිෂ්ක්‍රීය කොට්ඨාසය**

2024.01.18 වන දින සවස් කාලයේදී කොටහේන පොලිස් වසමේ කොටහේන, කොළඹ 13 ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සෝදිසි කිරීම් හා බෝම්බ නිෂ්ක්‍රීය කොට්ඨාසයේ සංග්‍රාමික යතුරුපැදි කණ්ඩායමේ නිලධාරීන් විසින් ලද තොරතුරු මත වැටලීමක් සිදු කර **ලොරි රථයකින් කසළ තේ කිලෝ 25,370 ක් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන කොටහේන** පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 21, 24 හා 42 වයස් වල පසුවන උස්සාපිටිය හා දෙවනගල ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.

කොටහේන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.